කර්මාන්ත අමාත්‍යාංශය
கைத்தொழில் அமைச்சு
Ministry of Industries







# කාර්මික සංවර්ධන මණ්ඩලය

## කාර්ය සාධන විශ්ලේෂණ වාර්තාව

සැලසුම් අංශය - 2024

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 1966 දී 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ආරම්භ කරන ලද අතර ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය එහි වර්තමාන ස්වරූපයෙන් 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාගත කර ඇත. මෙම පනතට අනුව කාර්මික සංවර්ධනයේ නියැළී සිටින ආයතන ප්‍රවර්ධනය කිරීම සඳහා කර්මාන්තකරුවන්ට මූල්‍ය, තාක්‍ෂණික සහ පරිපාලන සහාය ලබා දෙන අතරම, රටේ කාර්මික අංශයේ සංවර්ධනයේ වගකීම පැවරී ඇති ප්‍රධාන ක්‍රියාකාරී හස්තය සහ ප්‍රමුඛතම ආයතනය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වේ. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීමයි. වර්තමානයේ එය රටේ ආර්ථිකයේ පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ සියලුම කර්මාන්තවල නිසි සම්බන්ධීකරණයක් සහ අන්තර් සම්බන්ධිත වර්ධනයක් සඳහා සහාය වීම සඳහා විවිධ සේවාවන් සපයයි. තවද ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් කාර්මික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය  කර්මාන්තවල භාවිතා වන තාක්ෂණික ක්‍රියාවලීන් සහ ක්‍රම වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා සුදුසු තාක්ෂණයන් සහ උපකරණ සංවර්ධනය කිරීම සිදු කරයි. මීට අමතරව, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ජාත්‍යන්තර වෙළඳ ක්ෂේත්‍රයේ විදේශීය වෙළඳපල වෙත දේශීය කාර්මික නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය කරන අතර ශ්‍රී ලංකාවේ ඕනෑම කාර්මික ව්‍යාපාරයකට හෝ කාර්මික ආයතනයකට හෝ ඊට අදාළව අවශ්‍ය සේවා සහ පහසුකම් සපයයි. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය එහි ආරම්භයේ සිට පසුගිය වසර 53 තුළ රජයන් වෙනස්වීමත් සමඟ අමාත්‍යාංශ කිහිපයක් යටතේ ක්‍රියාත්මක විය. දැනට කර්මාන්ත අමාත්‍යාංශයේ පරිපාලන විෂය පථය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ක්‍රියාත්මක වේ.

**දැක්ම**

"සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත සංවර්ධනය කිරීම"

**මෙහෙවර**


"ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායික, තාක්ෂණික හා වාණිජමය පදනම සකසා දීම"

**ප්‍රධාන අරමුණු**

1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ අර්ථ දක්වා ඇති මණ්ඩලයේ අරමුණු පහත පරිදි වේ:

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිගැන්වීම, ප්‍රවර්ධනය හා සංවර්ධනය සඳහා සහාය වීම.
- රටේ ආර්ථිකයෙහි පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සියලු කාර්මික ආයතනවල නිසි සම්බන්ධීකරණය හා අන්තර් සම්බන්ධතාවය වර්ධනය කිරීම සඳහා සහාය වීම.
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝගී කරගැනීම, කර්මාන්තවල භාවිතාවන තාක්ෂණික ක්‍රියාවලීන් හා ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා සුදුසු තාක්ෂණය හා උපකරණ සංවර්ධනය කිරීම සහ අපද්‍රව්‍ය කාර්යක්ෂමව  භාවිතා කිරීම සඳහා ක්‍රියාවලි සහ ක්‍රමවේදයන් සොයා ගැනීම යන අරමුණු පෙරදැරිව කාර්මික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- දේශීය කාර්මික නිෂ්පාදන විදේශීය වෙළඳපොළට අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ, තාක්‍ෂණික පහසුකම් සහ නීති උපදෙස් ලබාදීම ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති කවර හෝ කාර්මික ආයතනයකට හෝ ව්‍යාපාරයකට සම්බන්ධව හෝ ඊට අදාළව අවශ්‍යවන සෑම ආකාරයකම සේවා සහ පහසුකම් සැපයීම.

**කර්මාන්ත සඳහා සපයනු ලබන ප්‍රධාන සේවා සහ පහසුකම්**




**ඉදිරි ඉලක්ක**

- "ව්‍යාපාර කිරීමේ පහසුව" ශ්‍රේණිගත කිරීම 99 සිට 2030 වන විට 50 ට පහළ දක්වා අඩු කිරීම.
- ව්‍යවසායකත්ව ප්‍රතිශතය 2030 වන විට 2.8% සිට 10% දක්වා වැඩි කිරීම (කර්මාන්ත ගොඩනැගීම වැඩි කිරීම).
- මෙරට දළ දේශීය නිෂ්පාදනය සඳහා නිෂ්පාදන කර්මාන්තයේ දායකත්වය, 2030 වන විට 15% සිට 25% දක්වා වැඩි කිරීම (නව / පවතින කර්මාන්තයන්හි ස්ථාවරවය ඇති කිරීම).
- දැනට පවතින ඒක පුද්ගල අපනයන ආදායම 2030 වන විට 596US$ සිට 1527US$ දක්වා ද ගෝලීය සාමාන්‍ය 50% (3055US$) දක්වා ද වැඩි දියුණු කිරීම.
- 2030 වර්ෂය වන විට කර්මාන්ත පිහිටුවීම සඳහා වන ඉඩම් ප්‍රමාණයේ ප්‍රතිශතය 0.04% සිට 1% දක්වා වැඩි කිරීම.
- සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම, හරිත තාක්ෂණය හා ආර්ථික සංකල්ප භාවිතය තුලින් කර්මාන්ත ආශ්‍රිත හරිතාගාර වායු විමෝචනය 2030 වන විට 7% දක්වා අඩු කිරීම.

අභියෝග

1. **ගෝලීය වෙළෙඳපොළ වෙත ළඟා වීමට ඇති බාධක.**

    - අපනයන වෙළෙඳපොළ සබඳතා ගොඩනඟා ගැනීමට සහ නවීන තාක්ෂණය මෙරටට ගෙන ඒම සඳහා විදේශ තානාපති කාර්යාලවල සේවය ලබා ගැනීම අවශ්‍ය වේ.
    - දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ගෝලීය වෙළෙඳපොළට ළඟා වීමට බාධාවක් වන තාක්ෂණික හිඩැස්වලට විසඳුම් සෙවීම අවශ්‍ය වේ.
    - හිතකර ආර්ථිකයන් (FTAs) සමඟ නව ආර්ථික හවුල්කාරිත්වයන් නොමැති වීම හේතුවෙන් ගෝලීය වෙලඳපොල වෙත ළඟා වීමට ඇති බාධක ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය වේ.
    - නිලධාරිවාදී ක්‍රියා පටිපාටි ලිහිල් කිරීමෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අපනයනයට ඇතුළු වීමට පහසුකම් සැලසීම අවශ්‍ය වේ.
    - ප්‍රමිතිගත නිෂ්පාදන පරීක්ෂණ සහ සහතික කිරීමේ පහසුකම් දැරිය හැකි මිලකට ලබා දීම අවශ්‍ය වේ.

2. **කර්මාන්ත සඳහා පහසුවෙන් ලබාගත හැකි ඉඩම් නොමැතිකම.**

කාර්මික ඉඩම් නොමැතිකම යනු අපනයනය ඉලක්ක කරගත් නව ආයතන සඳහා සුදුසු ස්ථාන ස්වල්පයක් මෙන්ම ආයෝජකයින් සොයා ගැනීමට ඇති අවස්ථා අඩු බවයි. අද වන විට, ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 0.04%ක් පමණක් කාර්මික කලාප සඳහා කැප කර ඇති අතර, එය දළ දේශීය නිෂ්පාදිතයේ අපනයන වෙළෙඳපොළ කොටස වැඩිදියුණු කිරීමට ප්‍රමාණවත් නොවේ.

- නව ආයතන සහ ආයෝජන සඳහා අවස්ථා පුළුල් කිරීම සඳහා සෑම දිස්ත්‍රික්කයකින්ම මුළු භූමි ප්‍රමාණයෙන් 1%ක් ලබාගෙන ඒවා ඩිජිටල් ඉඩම් බැංකුවක් ලෙස මාර්ගගතව ලබා දීමෙන් කර්මාන්ත කලාපවලට අයත් භූමි ප්‍රමාණය පුළුල් කිරීම අවශ්‍ය වේ.
- නවීන තාක්ෂණය සමඟ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

3. **බලපත්‍ර ලබාගැනීමේ බාධා.**

ක්‍රියා පටිපාටිවල සංකීර්ණතාවය, එවැනි ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම සහ ව්‍යාපාර ලියාපදිංචිය ලබා ගැනීම සඳහා රජයේ කාර්යාලවල බොහෝ පියවර අවශ්‍ය වන සංකීර්ණ ක්‍රියා පටිපාටි වැනි නියාමන බාධක හේතුවෙන් කර්මාන්තය සඳහා බලපත්‍ර ලබා ගැනීමේ ඉහළ ක්‍රියාමාර්ග ව්‍යාපාරය පවත්වාගෙන යාමට ප්‍රධාන බාධාවක් ලෙස හඳුනාගත හැකිය.

- ඉතා දූෂිත නොවන, ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවන සහ උපායමාර්ගික වැදගත්කමක් නොමැති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වසර දෙකක කාලසීමාවක් සඳහා බලපත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කිරීම අවශ්‍ය වේ.
- නව කර්මාන්ත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය වඩාත් ඵලදායි කිරීම සඳහා සරල කිරීම අවශ්‍ය වේ.(BR සහ වෙළඳ බලපත්‍ර අවම ලියකියවිලි සහිත එක් ස්ථානයකදී නිකුත් කළ යුතුය).
- ගෘහස්ථ නියාමනයක් තිබීම අවශ්‍ය වේ.

## 4. මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැතිවීම.

මූල්‍ය හිඟය (ණය ලබා ගැනීමේ දුෂ්කරතා) - මෙම ව්‍යවසායයන්ගේ වර්ධනය සහ ව්‍යාප්තිය පවත්වා ගැනීම සඳහා අමතර අරමුදල් අවශ්‍ය වුවද ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් නොමැතිකම බරපතල අභියෝගයක් ලෙස පවතී.

- ව්‍යවසායකයින් සඳහා ණය ඇපකර පද්ධතියක් හෝ ණය රක්ෂණයක් ස්ථාපිත කිරීම අවශ්‍ය වේ (ඇප රහිත ණය).
- ව්‍යාපාර ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා අඩු පොලී අනුපාත සහිත බැංකු ණය පහසුකම් සැලසීම අවශ්‍ය වේ.

## 5. ස්ථාවර ජාතික ප්‍රතිපත්තියක් නොමැතිවීම.

කර්මාන්ත සඳහා වත්මන් ආයතනික රාමුව තුළ ඒකාබද්ධ ජාතික උපාය මාර්ගයක් නොමැතිකම ශ්‍රී ලංකාව තුළ වඩාත් නව්‍ය කර්මාන්ත වර්ධනය කිරීම සහ සියලුම ප්‍රධාන අංශවල ඵලදායිතාව, තිරසාරභාවය ඉහළ නැංවීම ඉලක්ක කරගත් ස්ථාවර ජාතික කාර්මික ප්‍රතිපත්තියක් අවශ්‍ය වීම ප්‍රධාන අභියෝගයක් ලෙස හඳුනාගෙන ඇත.

- රට තුළ ව්‍යාපාරික කටයුතු සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකය අද සිටින 99 වැනි ස්ථානයේ සිට 2030 වන විට 50 වැනි ස්ථානය දක්වා ඉහළ නැංවීම අවශ්‍ය වේ.
- ආනයනය කිරීමට අවශ්‍ය සහ දේශීයව ලබා ගත නොහැකි අමුද්‍රව්‍ය සහ අතරමැදි ද්‍රව්‍යවලින් බදු ඉවත් කිරීම අවශ්‍ය වේ.
- නිමි භාණ්ඩ ආනයනය සඳහා බදු පැනවීම අවශ්‍ය වේ.
- සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන්ට බදු සහනයක් ලබාදීම අවශ්‍ය වේ.
- කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ඊළඟ මට්ටමට ගොඩ නැගීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම සඳහා සුපිරි වෙළඳසැල්වල අවම වශයෙන් වර්ග අඩි 200ක් වෙන් කිරීමට අවශ්‍ය වේ.

## 6. අඩු ව්‍යවසායකත්ව ධාරිතාව.


කම්කරු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන වාර්තා කරන පරිදි, ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් 2.8% ව්‍යවසායකයින් වේ. නව ධනය සහ රැකියා උත්පාදනය කරමින් ජාතිය ඉදිරියට ගෙනයාම සඳහා ශ්‍රී ලංකාවට අවම වශයෙන් 10% ව්‍යවසායකයින් අවශ්‍ය වන බැවින් රටේ ආර්ථික වර්ධනයට මෙය අතිශයින් ප්‍රමාණවත් නොවේ.

- පවතින වෘත්තීන් සෙවීමට සිසුන් සූදානම් කිරීමේ සිට වෘත්තීන් උත්පාදනය කිරීමට සිසුන් සූදානම් කිරීම දක්වා වර්තමාන සමාජීය අවධානය වෙනස් කිරීම සඳහා පාසල් විෂය නිර්දේශයට හඳුන්වාදීම සහ ප්‍රායෝගික ව්‍යවසායකත්ව වැඩසටහන් ඇතුළත් කරමින් වත්මන් අධ්‍යාපන ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය වේ.
- රට තුළ ව්‍යවසායක සංස්කෘතියක් ඇති කිරීම අවශ්‍යයි.
- ශක්තිමත් ව්‍යවසායකත්ව සංස්කෘතියක් ඇති කිරීමට සහ එය සමාජය විසින් පිළිගනු ලැබීමට ප්‍රමාණවත් කාලයක්/ඉඩක් වෙන් කිරීම සඳහා සියලුම රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍යවල අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.
- තාක්ෂණික දැනුම නොමැතිකම දැවෙන ප්‍රශ්නයක් ලෙස හඳුනාගෙන ඇති බැවින් ව්‍යවසායකත්ව පුහුණුව සහ තාක්ෂණ හුවමාරු පහසුකම් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

## ප්‍රගතිය

### ආදායම් ප්‍රකාශ විශ්ලේෂණය

ප්‍රස්ථාරය 2.1.1: ආදායම, විකුණුම් සහ සේවා පිරිවැය, දළ ලාභය සහ ශුද්ධ ලාභය





| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|
| Sales | 284 | 466 | 384 | 398 | 395 | 513 |
| Cost of Sales | 188 | 323 | 263 | 245 | 277 | 323 |
| Gross Profit | 96 | 142 | 121 | 153 | 118 | 191 |
| Net Profit | 18 | 0 | 14 | 8 | 78 | 142 |

වර්ෂය

කාලපරිච්ඡේදය තුල ආදායම, විකුණුම් සහ සේවා පිරිවැය, දළ ලාභය සහ ශුද්ධ ලාභය උච්චාවචනය වී ඇති අතර 2018 වසරේදී ආයතනය ලාභ හෝ පාඩුවක් ලබාගෙන නොමැත. 2021,2022 වසර වලදී ක්‍රමිකව ලාභය වැඩි කරගෙන ඇති අතර මෙම කාලපරිච්ඡේදය තුල ලබා ඇති ඉහලම ශුද්ධ ලාභය 2022 වසරේදී ලබා ගෙන ඇත. තවද ඉහත දක්වා ඇති රූප සටහනට අනුව, පෙර වර්ෂවලට සාපේක්ෂව, නවීන තාක්ෂණික ක්‍රම සහ නිෂ්පාදන ක්‍රියාවලීන් සමඟ ප්‍රතිලාභීන්ගේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා නව සංවර්ධන වැඩසටහන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

### මූල්‍ය තත්ත්වය විශ්ලේෂණය


ප්‍රස්ථාරය 2.2.1 : ස්ථාවර වත්කම්, ජංගම වත්කම් සහ ආයෝජන




| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|
| Fixed Assets | 1,485 | 1,610 | 1,650 | 1,666 | 1,708 | 1,725 |
| Current Assets | 299 | 239 | 277 | 308 | 336 | 547 |
| Investments | 60 | 66 | 73 | 80 | 85 | 85 |

වර්ෂය

**ප්‍රස්ථාරය 2.2.2 : කෙටිකාලීන හා දිගුකාලීන වගකීම්**





2017 වසරේ සිට ආයතනයේ ස්ථාවර වත්කම්, ජංගම වත්කම් හා ආයෝජන වල ක්‍රමික වැඩි වීමක් පෙන්නුම් කරන අතර 2017 වසරට සාපේක්ෂව අනිකුත් වසර වල කෙටිකලීන හා දිගුකාලීන වගකීම් වල ක්‍රමික වැඩිවීමක් පෙන්නුම් කරයි.


### පුරෝකථනය කළ අගයන්

| වර්ෂය | ආදායම | විකුණුම් පිරිවැය | දළ ලාභය | ශුද්ධ ලාභය | පරිපාලන වියදම් | විකුණුම් බෙදාහැරීමේ වියදම් | මුල්‍ය පිරිවැය | ස්ථාවර වත්කම් | ජංගම වත්කම් | ආයෝජන | කෙටිකාලීන වගකීම් | දිගුකාලීන වගකීම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2023** | 544 | 358 | 185 | 16 | 732 | 340 | 1 | 522 | 741 | 1,200 | 418 | 188 |
| **2024** | 920 | 690 | 230 | 20 | 740 | 700 | 2 | 622 | 780 | 1,300 | 500 | 230 |
| **2025** | 1012 | 759 | 253 | 22 | 814 | 770 | 2.2 | 684.2 | 858 | 1430 | 550 | 253 |

**ප්‍රස්ථාරය 2.3.1 : ආදායම, විකුණුම් සහ සේවා පිරිවැය, දළ ලාභය සහ ශුද්ධ ලාභය**




**ප්‍රස්ථාරය 2.3.2 : ස්ථාවර වත්කම්, ජංගම වත්කම් සහ ආයෝජන**




| | 2023 | 2024 | 2025 |
|---|---|---|---|
| Fixed Assets | 522 | 622 | 684.2 |
| Current Assets | 741 | 780 | 858 |
| Investments | 1,200 | 1,300 | 1430 |

වර්ෂය

**ප්‍රස්ථාරය 2.3.3 : කෙටිකාලීන හා දිගුකාලීන වගකීම්**




| | 2023 | 2024 | 2025 |
|---|---|---|---|
| Short Term Liabilities | 418 | 500 | 550 |
| Long Term Liabilities | 188 | 230 | 253 |

වර්ෂය

**ඉහත දත්ත සහ තොරතුරු මත පදනම්ව පවතින තත්ත්වය පිළිබඳ සංවිධානයේ නිරීක්ෂණ**

දේශීය කර්මාන්තවලට විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහ අනාගත ව්‍යවසායකයින්ට තම ව්‍යවසායන් වඩ වඩාත් වාණිජමය වශයෙන් ශක්‍ය සහ අපනයනය නැඹුරු කර ගැනීමට සහාය වන අතරම සේවා ප්‍රවර්ධනය කිරීමේ වගකීම කාර්මික සංවර්ධන මණ්ඩලයට පැවරී ඇත. තවද දිගුකාලීන ව්‍යාපාරික සබඳතා තුළින් අදාළ නිෂ්පාදන සඳහා සන්නාම ප්‍රතිරූපය ගොඩනඟන අතරම දේශීයව සහ ජාත්‍යන්තරව විභව වෙළෙඳපොළ සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීමට සහය වීමේ වගකීම IDB සතු වේ. එබැවින්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධනය ඉලක්ක කර ගනිමින් පවත්වනු ලබන වැඩසටහන් සහ ඉදිරි කාලසීමාව තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමට යෝජිත වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

- දේශීය කර්මාන්ත අන්තර්ජාතික වෙළෙඳපොලට ගෙනයාම ඉලක්ක කර ගනිමින් ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය BMICH හිදී පැවැත්වීම හා ඊට සමගාමීව “කර්මාන්ත 2023” – යාපනය, මහනුවර බෝගම්බර පිටියේ කාර්මික ප්‍රදර්ශනය හා දෙසැම්බර් මාසයේදී ගාල්ල දිස්ත්‍රිකයේ කර්මාන්ත ප්‍රදර්ශනයක් පැවැත්වීම.
- ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයට සමගාමීව ජූනි 22 ජාතික කර්මාන්ත දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීම සහ ජාතික කර්මාන්ත සතියක් නම් කිරීම.

- පාසැල් තුල ව්‍යවසාය සංවර්ධන කව පිහිටුවීම (School Industry Entrepreneurial Circle) හා මෙම ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කරමින් ඉදිරියේදී විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම.
- විවිධ කර්මාන්ත ක්ෂේත්‍රයන් ලෝක වෙළෙඳපොළට සාර්ථකව ප්‍රවේශ වීමට අවශ්‍ය මගපෙන්වීම් ලබාදීමේ අරමුණින් ජාතික ආහාරපාන ආශ්‍රිත සමුළුව හා ජාතික රබර් සහ ප්ලාස්ටික් සමුළුව 2023 වර්ෂය තුල පැවැත්වීම.
- අපනයන නැඹුරු ආර්ථිකයක් ඇතිකිරීමේ අරමුණින් ජාත්‍යන්තර ප්‍රදර්ශනයන් වන "මොස්කව් හි ලෝක ආහාර ප්‍රදර්ශනය, 20 වැනි චීන - ආසියාන් ප්‍රදර්ශනය හා වියට්නාමයේ Ha Noi හි ශ්‍රී ලාංකික SME නිෂ්පාදන ආශ්‍රිත ප්‍රදර්ශනය" සඳහා දේශීය කර්මාන්තකරුවන් සම්බන්ධීකරණය කිරීම.
- ක්ෂුද්‍ර, කුඩා, මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත 300කගේ කැපවීම සහ දායකත්වය අගයමින් ඔවුන්ගේ අපනයන් තවදුරටත් සවිබල ගැන්වීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය සහ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් “ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන උළෙල 2023” පැවැත්වීම.
- ශ්‍රී ලාංකේය කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා ප්‍රථම විද්‍යුත් රූපවාහිනී නාලිකාව ලෙස "ඉන්ඩස්ට්‍රි ටීවී" හඳුන්වාදීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයේ කාලීන සිදුවීම් යාවත්කාලීන කරමින් කර්මාන්ත සඳහා වෙන්වූ "Industry Magazine" හඳුන්වාදීම.
- දේශීය ව්‍යවසායකයින් හට ගෝලීය වෙළෙඳපොළ වෙත ළඟා වීමට ඇති බාධක හඳුනාගනිමින් විදේශීය ආර්ථිකයන් සමඟ නව ආර්ථික හවුල්කාරිත්වයක් ඇතිකරගැනීම සඳහා විශාල විභවයන් ඇති විදෙස් රටවල විදේශ තානාපති කාර්යාල හරහා සම්බදතා ගොඩනගාගැනීමේ (Connect Sri Lanka) අවකාශය සැලසීම.
- ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් කර්මාන්ත සංවර්ධන පනතට අනුව කාර්මික සංවර්ධන අරමුදල පිහිටුවන ලද අතර එමගින් ලක්ෂ 5ක ණය සීමාවකට යටත්ව සුළු පරිමාණ කර්මාන්තකරුවන් හට කාරක ප්‍රාග්ධන හා ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ණය ලබාදීම සිදුකෙරේ.

## ඉදිරි අභියෝග සහ ඒවා ජයගැනීම සඳහා යෝජනා

### අභියෝග

- කාර්මික සංවර්ධන පනත බලගැන්වීම - කර්මාන්ත දිරිගැන්වීම, ප්‍රවර්ධනය හා සංවර්ධනය සඳහා වන මූලික අඩිතාලම හා පසුබිම් සහාය 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත නැවත බලගැන්වීම තුළින් ලබාදීමට කටයුතු කළ යුතු වීම. ඒ සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ පූර්ණ මැදිහත්වීම සහ මුල්‍ය ප්‍රතිපාදන අත්‍යවශ්‍ය වන අතර මෙය ජාතික අවශ්‍යතාවයක් සේ ප්‍රමුඛතාවය ලබාදිය යුතු කාරුණක් වේ.
- කර්මාන්තපුර ඇතිකිරීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීමේදී ඇතිවන ගැටළු - බොහෝ ඉඩම් වල හිමිකාරීත්වය පිළිබඳ දත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නොමැතිවීම සහ අයිතිකරුවන්ට වන්දි මුදල් ගෙවීමේ ක්‍රමවේදයන් වල අඩුපාඩුකම් පැවතීම.
- සේවාලාභීන්ට ගුණාත්මක සහ කඩිනම් සේවා සැපයීම සම්බන්ධයෙන් ඇති අභියෝග. උදා: සේවා පිරිවැය දැරීමට අපහසු වීම, කාලය ගතවීම, යාවත්කාලීන හා නවීන තාක්‍ෂණය/තාක්ෂණික දැනුම නොමැතිකම, සාම්ප්‍රදායික/යල් පැන ගිය නීති සහ රෙගුලාසි හේතුවෙන් වෙනත් ආයතනවල සහය ලබාගැනීමේ දුෂ්කරතා, යාවත්කාලීන වූ කාර්මික දත්ත සහ තොරතුරු නොමැතිකම.

යෝජනා

- ඩිජිටල් ඉඩම් බැංකුවක් සකස් කිරීම - අන්තර්ජාලය හරහා ඉඩම් තෝරා ගැනීමට ව්‍යවසායකයින්ට පහසුකම් සැලසිය හැක.
- කර්මාන්ත හිතකාමී නීති සහ රෙගුලාසි සැලසුම් කිරීම සහ බලාත්මක කිරීම/කාර්මික ක්‍රියාකාරකම් පිළිබඳ පවතින නීති සහ රෙගුලාසි වැඩිදියුණු කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආශ්‍රිත රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල සේවා සැපයීමේ ගුණාත්මක භාවය සහ ප්‍රවේශය වැඩිදියුණු කිරීම.
- කාර්මික ගැටළු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය ඇති ඉහළ මට්ටමේ කාර්මික කොමිෂන් සභාවක් පිහිටුවීම.
- ඉල්ලුම මත පදනම් වූ තාක්ෂණ හුවමාරු පුහුණු සහ කුසලතා සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම.
- රැකියා සොයන්නන් වෙනුවට රැකියා නිර්මාපකයින් බිහි කිරීම සඳහා අධ්‍යාපන ආයතනවල සහ තාක්ෂණික හා වෘත්තීය වැඩසටහන්වල විෂය මාලාවේ ව්‍යවසායකත්ව වටිනාකම්, චින්තනය සහ ආකල්ප ශක්තිමත් කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ප්‍රති-මූල්‍යකරණ යෝජනා ක්‍රම, බැංකු සායන, භාණ්ඩාගාර ඇපකර සහ ඇපකර නොවන ණය සඳහා ප්‍රවේශය පුළුල් කිරීම.
- අමුද්‍රව්‍ය මත පනවා ඇති බදු ප්‍රතිපත්ති සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
- දිස්ත්‍රික් කර්මාන්ත සංගම් සහ කාර්මික අංශයේ සම්මන්ත්‍රණ පිහිටුවීම මගින් කර්මාන්ත වර්ධනය පිළිබඳ ගැටලු විසඳීම සඳහා ඵලදායී වේදිකාවක් සැකසීම.
- ඇසුරුම්කරණය, සන්නාමකරණය, ප්‍රමිතිකරණය, නිෂ්පාදන සංවර්ධනය සහ ඩිජිටල් අලෙවිකරණය යනාදිය පිළිබඳ පුහුණුව ලබා දීමෙන් ගෝලීය වශයෙන් තරඟකාරී කර්මාන්ත අංශයක් ගොඩනැගීමට පහසුකම් සැලසීම.
- ආනයන ආදේශන හෝ අභ්‍යන්තර නැඹුරු වෙළඳ ප්‍රතිපත්ති පැනවීම.
- අපනයනය ඉලක්ක කරගත් හෝ පිටතට නැඹුරු වූ වෙළඳ ප්‍රතිපත්ති පැනවීම.
- සම්බන්ධතාවය, වෙළඳ පහසුකම්, දේශීය සහ ගෝලීය වෙළඳපල වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම.
- "ඉඩම් බැංකුව" පිහිටුවීම සඳහා සුදුසු ඉඩම් සොයා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ ආකර්ෂණය කර ගැනීම.
- අදාළ නිෂ්පාදන කාණ්ඩවල මිල සාධාරණ ස්ථාවරත්වයක් පවත්වා ගැනීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන ආනයනය පාලනය කිරීම.
- දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා ව්‍යාපාරික ප්‍රජාවට හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම.
- දේශීය ව්‍යවසායකයින් ආරක්ෂා කිරීම, ශක්තිමත් කිරීම මෙන්ම ව්‍යවසායකත්ව සංවර්ධනයට පහසුකම් සැලසීම.
- පාසල්, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ව්‍යවසායකත්ව කව හඳුන්වාදීම මගින් ධනාත්මක ව්‍යවසායක සංස්කෘතියක් සහ පරිසරයක් නිර්මාණය කිරීම.